සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 08 - 2023

## චිත්‍ර කලාව - I කොටස

කාලය පැය 01 යි

නම / විභාග අංකයඃ

සැලකිය යුතුයි.

- ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

- පහත දැක්වෙන රූප සටහන් ඇසුරු කරගෙන අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.



01. ඉහත රූපයේ දැක්වෙන වාස්තු විද්‍යා අංගය ........................................................................................ නමින් හැඳින්වේ.

02. ................................................................................ දාගැබ සතර දිශාවේ මෙම අලංකාර වාස්තු විද්‍යා අංගය දැකගත හැකිය.

03. මෙහි දක්නට ඇති දාගැබ ................................................................................ රජතුමා විසින් කරවන ලද්දකි.

04. මෙම පින්තූරයේ දැක්වෙන වාස්තු විද්‍යා අංගය අලංකාර ………………………………….වලින් අලංකාර කර ඇත.

05. මෙම ස්ථූපය වටා දක්නට ඇති ……………………………………. නැමති වාස්තු විද්‍යා අංගය සද්ධාතිස්ස රජතුමා විසින් කරවන ලද්දකි.

- ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

06. ශ්‍රී ලංකාවේ කලා කර්මාන්ත අතර ''පූසාන්දිරම්'' නැමති රටා වර්ගය යොදනු ලබන්නේ,
    1. පන් කර්මාන්තයේය.
    2. තල්කොළ කර්මාන්තයේය.
    3. නියද පැදුරු කර්මාන්තයේය.
    4. රුකඩ කර්මාන්තයේය.

07. බුදු පිළිමවල ආසන ක්‍රම අනුව වම් පාදය මත දකුණු පාදය තබා වාඩිවී සිටින ආසන ක්‍රමය වන්නේ,
    1. පද්මාසන ක්‍රමයයි.
    2. භද්‍රාසන ක්‍රමයයි.
    3. වීරාසන ක්‍රමයයි.
    4. පර්යංක ආසන ක්‍රමයයි.

08. ඊතල පහර කා ඉදිරියට පනිමින් සිටින බයිසන් ගව රුව සහ බිම වැතිර සිටින මිනිසෙකුගේ රුව සහිත චිත්‍රය දක්නට ඇත්තේ,

1. ලැස්කෝ ගුහාවේය.
2. ඇල්ටමයිරා ගුහාවේය.
3. ෆොන්ඩිගෝම් ගුහාවේය.
4. කෝගුල් ගුහාවේය.


09. සිංහල සැරසිලි මෝස්තර අතර නිර්ජීවී ගණයට අයත් මෝස්තරයකි.

1. යාලි රුව
2. කඩුපුල් මල
3. ලියවැල
4. අරිම්බුව


10. පත්තිනි දෙවඟන හා දෙවොල් දෙවියන් මුල් කරගෙන රුවන්වැල්ල ආශ්‍රිතව පැවැත්වූ සබරගමු නර්තන සම්ප්‍රදායික ශාන්ති කර්මය වන්නේ,

1. කොහොඹ කංකාරි ශාන්තිකර්මයයි.
2. දෙවොල්මඩු ශාන්තිකර්මයයි.
3. පහන් මඩු ශාන්තිකර්මයයි.
4. කුම්බාබිෂේකම් ශාන්තිකර්මයයි.


- ප්‍රශ්න අංක 11 - 15 තෙක් දී ඇති ප්‍රශ්නවලට A, B,C, D, E යන රූප සටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.


A


B


C


D


E

11. A අක්ෂරයෙන් දැක්වෙන රටා පැදුරු විශේෂය විවීම සඳහා භාවිතා කරනු ලබන්නේ කුමන අමුද්‍රව්‍ය විශේෂයද?

..............................................................................................

12. B අක්ෂරයෙන් දැක්වෙන භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ලද මෙම උපකරණය කුමක්ද?

..............................................................................................

13. C අක්ෂරයෙන් දැක්වෙන චෛත්‍ය ඉදිකිරීම සඳහා මුල්වූ රජතුමා කවුද? ......................................................


14. D අක්ෂරයෙන් දැක්වෙන නිර්මාණයේ දක්නට ලැබෙන ආසනය හඳුන්වන නම කුමක්ද?


..............................................................................................

15. E අක්ෂරයෙන් දැක්වෙන උද්භිද ගණයට අයත් සැරසිල්ල පාලි භාෂාවෙන් හඳුන්වන්නේ කුමන නමකින් ද?


..............................................................................................

- ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් දී ඇති රූප වලට වඩාත් සෘජු සම්බන්ධතාවයක් දක්වන රූපය ඉදිරියෙන් ඇති F G, H, I, J යන රූප අතුරෙන් තෝරා එහි අංකය තිත් ඉරමත ලියන්න.


16.  ........................................



F

17.  ........................................


G


18.  ........................................


H

19.  ........................................


I

20.  ........................................


J

(4) WWW.PastPapers.WiKi (3)
Download Term Test Papers, Short Notes From One Place!

- **ප්‍රශ්න අංක 21 සිට 25 තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍ය බැගින් ලියන්න.**

21. රංජිත වීදුරු ..............................................................................................................................

22. ඇල්ටමයිරා ..............................................................................................................................

23. හංසපූට්ටුව ..............................................................................................................................

24. කදිර්පායි ..............................................................................................................................

25. සංඛනිධි ..............................................................................................................................

- **ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා දී ඇති පින්තූරය හඳුනාගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**



26. ඉහත දැක්වෙන කලා කර්මාන්තය කුමන නමකින් හැඳින්වේද? ..............................................................................

27. මෙහි දැක්වෙන මූර්ති නිර්මාණය කර ඇති ශිල්පක්‍රමය කුමක්ද? ..............................................................................

28. මෙම නිර්මාණ කිරීම සඳහා මාධ්‍ය සකස් කර ගන්නේ කෙසේද? ..............................................................................

29. ශ්‍රී ලංකාවේ කුමන යුගයේ සිට මෙම කර්මාන්තය පැවත එන බවට සාධක පවතී ද? ..............................................................................

..............................................................................................................................

30. මෙම කලා කර්මාන්තය පැතිර ඇති ප්‍රදේශ මොනවා ද? ..............................................................................

PAST PAPERS WIKI
(4) WWW.PastPapers.WiKi (4)

Download Term Test Papers, Short Notes From One Place!

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

**තෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023**
**Third Term Test - Grade 08 - 2023**

## චිත්‍ර කලාව II කොටස/ III කොටස

**කාලය පැය 02 යි**

නම / විභාග අංකය:

### II කොටස

**සැලකිය යුතුයි.**

- **II පත්‍රය සමග අමුණා බාර දෙන්න.**
- පන්ති කාමරයේදී ඔබ අඳින ලද ක්‍රෝටන් අත්තක් දැමූ කළයක් සහ පෙට්ටියක් ඇඳ පැන්සලෙන් වර්ණ කරන්න.

( ලකුණු 20 යි. )

### III කොටස

- ඔබේ නම/ විභාග අංකය හා චිත්‍ර මාතෘකාව චිත්‍රය පසුපිටේ සඳහන් කරන්න.
- දී ඇති මාතෘකාවලින් 01 ක් පමණක් තෝරා වර්ණවත් එක් චිත්‍රයක් පමණක් අඳින්න.

01. ගමේ පන්සලේ ශ්‍රමදානයක්.
02. අස්වනු නෙළන ගොවි ගෙවිලියෝ.
03. සාම්ප්‍රදායික ශෛලී ලක්ෂණයන්ගෙන් යුත් වනයක අසිරිය.
04. සාම්ප්‍රදායික මෝස්තර ඇසුරෙන් සරම් වාටියකට මෝස්තරයක්.
05. මල් කොළ පොහොට්ටු ගෙඩි යොදා චීත්තයකට සුදුසු ව්‍යාප්ත මෝස්තරයක්.
06. මැටි බඳුනකට සුදුසු හැඩයක් ඇඳ අලංකාර මෝස්තර යොදා වර්ණ කරන්න.
07. ළමා ගීතයකට සුදුසු සන්නිදර්ශන චිත්‍රයක් අඳින්න.

( ලකුණු 50 යි. )

(2) WWW.PastPapers.WiKi (1)



Download Term Test Papers, Short Notes From One Place!

(2) WWW.PastPapers.WiKi (2)
Download Term Test Papers, Short Notes From One Place!

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## Provincial Department of Education - NWP

**තෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023**
**Third Term Test - Grade 08 - 2023**

# චිත්‍ර කලාව - පිළිතුරු පත්‍රය

01.) වාහල්කඩ
02.) රුවන්මැලි සෑ
03.) දුටුගැමුණු
04.) මල් ලියකම්
05.) ඇත්පවුර
06.) 2
07.) 3
08.) 1
09.) 4
10.) 3
11.) තල්කොළ
12.) අත්සකපෝරුව
13.) නිශ්ශංකමල්ල
14.) පද්මාසනය
15.) කුමුදුප්පල
16.) I
17.) F
18.) J
19.) H
20.) G
21.) ක්‍රිස්තියානි දේවස්ථානවල කවුළුවල අලංකාර චිත්‍ර නිරූපිත වර්ණ වීදුරු රංජිත වීදුරු වේ.
22.) ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ස්පාඤ්ඤයේ ඇති ගුහාවකි.
23.) සාම්ප්‍රදායික මෝස්තර අතර හංසයින් දෙදෙනෙකුගෙන් යුතු සැරසිල්ලකි.
24.) කෘෂිකර්මාන්ත කටයුතු/ ගොයම් පෑගීම/ වී වේලීම ආදියට භාවිතා කරන තල්කොළ පැදුරු විශේෂයකි.
25.) අභයගිරි විහාරය ඉදිරිපිට ඇති හග්ගෙඩියක් සහිත මුරගල වේ.
26.) පිත්තල කර්මාන්තය
27.) වාත්තු කිරීමේ ශිල්ප ක්‍රමය
28.) තඹ හා තුත්තනාගම් එකට මිශ්‍ර කිරීමෙන්
29.) අනුරාධපුර යුගයේ සිට.
30.) මහනුවර - පමුණුව, ගඩලාදෙනිය, පිළිමතලාව, කිරිවවුල, නත්තරම්පොත

මාතර - බෙලිඅත්ත ප්‍රදේශයේ අගුල්මඩුව

යාපනය - වන්නාර්පන්නෙයි

මඩකලපුව - පෙරියපෝරතිව්. (ස්ථාන 2 ක් ප්‍රමාණවත් වේ.)

( ලකුණු 30 යි. )

| | | |
|---|---|---|
| I පත්‍රයට | - | ලකුණු 30 යි. |
| II පත්‍රයට | - | ලකුණු 20 යි. |
| III පත්‍රයට | - | ලකුණු 50 යි. |
| මුළු ලකුණු | - | ලකුණු 100 යි. |

(2) www.PastPapers.WiKi (1)



Download Term Test Papers, Short Notes From One Place!

(2) WWW.PastPapers.WiKi (2)
Download Term Test Papers, Short Notes From One Place!

# LOL.lk BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

## ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න






| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**